**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය - 2021**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ "අධිකාරිය" 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම්/ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 76 (ඇ) ඡේදය අනුව වාර්තාකරණ දිනයෙන් පසුව මාස 12 ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම් ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, රු. 59,629,115 ක් වූ වර්ෂයක කාලයක් ඇතුළත කල්පිරෙන ස්ථාවර තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ආයතනය සතුව පැවති සත්දින තැන්පතු ත්‍රෛමාසික ස්ථාවර තැන්පතු බවට පරිවර්තනය කිරීම විගණන හා කළමනාකරණ කමිටු නිර්දේශ මත 2021 වර්ෂයේ දී සිදු කරන ලදී. පසුගිය වර්ෂයන්හි ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් යටතේ ආයෝජන ශීර්ෂය තුළින් වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර තිබුණි. නමුත් කෙටුම්පත් විගණන වාර්තාවේ නිර්දේශ පරිදි 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් යටතේ වර්ගීකරණය කර ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. | ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් නිවැරදිව වර්ගීකරණය කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි 100 ඡේදය ප්‍රකාරව නිශ්චිතව තක්සේරු කළ නොහැකි අසම්භාව්‍ය වගකීම් සඳහා වෙන්කිරීම් සිදු නොකළ යුතු වුවද ඊට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට මහාධිකරණයේ සහ දිසා අධිකරණයේ සහ කම්කරු විනිශ්චය සභාවල විභාග වෙමින් පවතින නඩු | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති 08 හි 103 වන ඡේදය පරිදි අධිකාරියට එරෙහිව පවත්නා නඩු කටයුතු වලට අදාළව අසම්භාව්‍ය වගකීම් තක්සේරු කිරීමට බාහිර තක්සේරුකරුවෙකු යොදාගත යුතු බව දන්වා ඇත. එසේම ඉදිරි මූල්‍ය ප්‍රකාශන තුළින් අසම්භාව්‍ය වගකීම් නිශ්චිතව හඳුනාගත් කාර්යන් සඳහා | නිශ්චිතව තක්සේරු කළ නොහැකි අසම්භාව්‍ය වගකීම් පිළිබඳව ප්‍රමිතිය ප්‍රකාර සටහන් මඟින් හෙළිදරව් කළ යුතුය. |

| | | |
|---|---|---|
| කටයුතුවලට අදාළව අසම්භාව්‍ය වගකීමක් සඳහා රු. 4,605,250 ක ප්‍රතිපාදනයක් කර තිබුණි. එසේම ප්‍රමිතියෙහි 103 ඡේදය අනුව හෙළිදරව් කළයුතු අසම්භාව්‍ය වගකීම් මැනීම සඳහා බාහිර තක්සේරු භාවිතා කර ගත්තේ නම් එම තොරතුරුද අනාවරණය කර නොතිබුණි. | ගැලපීම් කිරීමටත් නිශ්චිත නොවන අසම්භාව්‍ය වගකීම් සඳහා සටහන් මගින් හෙළිදරව් කිරීමටත් කටයුතු කරන බව දන්වමි. | |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) තාවකාලික, අනියම්, දෛනික සහ ආදේශක යන පදනම මත බඳවාගත් සේවකයින් සඳහා 2019 සැප්තැම්බර් 01 දින සිට ලබා දුන් පත්වීම් අහිමිකිරීමට එරෙහිව කම්කරු කාර්යාලවල ගොනුකර ඇති පැමිණිලි විභාග කිරීමෙන් පසු රු. 2,167,236 ක හිඟ වැටුපක් ගෙවන ලෙසට දිස්ත්‍රික් කම්කරු කාර්යාලය විසින් 2020, 2021 සහ 2022 යන වර්ෂවල පෙබරවාරි සහ මාර්තු මාසවලදී නියෝග තුනක් ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂයේ ඒ වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණු අතර ඒ සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයක්ද සිදු කර නොතිබුණි. | තාවකාලික , අනියම් , දෛනික සහ ආදේශක යන පදනම් යටතේ බඳවාගත් සේවකයන් අනීතිකව බඳවා ගන්නා සේවකයන් බවට ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් ලබා දී ඇත. ඒ අනුව අදාළ සේවකයන්ගේ සේවය අවසන් කර ඇත. එහෙත් අදාළ පුද්ගලයින් විසින් කම්කරු කාර්යාල වෙත කරන ලද පැමිණිලි විභාගයන් තුළින් අදාළ අය සඳහා හිඟ වැටුප් රු.2,167,236 ක් ගෙවන ලෙස දැන්වීම මත ආයතනය විසින් අනීතික පත්වීම් වෙනුවෙන් හිඟ වැටුප් ගෙවීමේ හැකියාවක් නොමැති හෙයින් මේ සඳහා වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න පිළිබඳ අමාත්‍යාංශ උපදෙස් මත අභ්‍යන්තර පරීක්ෂණයක් සිදුවෙමින් පවතී. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුළින් ප්‍රතිපාදන වෙන් නොකළ බව දන්වමි. | හිඟ වැටුප් සඳහා මූල්‍ය ප්‍රකාශන තුළින් ප්‍රතිපාදන වෙන් කළ යුතුය. |
| (ආ) ව්‍යාප්ති කටයුතු සඳහා ජංගම සේවා රථයක් නිර්මාණය කිරීම වෙනුවෙන් සහ ඩිජිටල් ව්‍යාප්ති සන්නිවේදනය හා නියමුකරණ ඒකකයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් වැයකර තිබුණු රු. 9,900,000 ක ප්‍රාග්ධන වියදම් අයහාර වියදම් ලෙස සලකා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | ගොවි ජනතාව ආමන්ත්‍රණය කිරීමේ නවමු ක්‍රමෝපායක් වෙත නැඹුරු වෙමින් ඩිජිටල් තාක්ෂණය යොදා ගැනීම ප්‍රතිපත්තිමය වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශයන් තුළින් හඳුනාගත් අතර ඒ සඳහා ආයතනික කටයුතු එම අනුමැතිය මත ප්‍රතිපාදන වෙන්ව තිබූ සංවර්ධන ප්‍රාග්ධන යටතේ ව්‍යාප්ති වියදම් හි මූල්‍ය ප්‍රගතිය තුළින් ගැලපීම් කළ නමුත් 2022 මූල්‍ය ප්‍රකාශන තුළ පූර්ව වර්ෂ ගැලපීම් යටතේ නිවැරදි | ප්‍රාග්ධන වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් නොකර ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කර ප්‍රාග්ධනීත කිරිමට සටහන් කර ගතිමි. | |
| (ඇ)සමාලෝචිත වර්ෂයේ රු.73,907,078 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණු ඉඩම් වටිනාකම තුළ, අධිකාරියට අයිතිය පවරා නොගත් රජය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිය වැනි ආයතනවලට හිමි රු. 35,091,728 ක් වූ අක්කර 66 රූඩ් 31 ක ඉඩම්ද ඇතුළත් කර තිබුණු නමුත් මෙම ඉඩම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. තවද ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය අධිකාරියට පවරා ගෙන නොමැති ප්‍රාදේශීය කාර්යාල හතරක රු.71,856,901 ක් වටිනා ගොඩනැගිලි ඉදිකර තිබුණි. | මහවැලි අධිකාරිය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හා රජයට අයත් වෙනත් ආයතනවලින් අධිකාරිය වෙත ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා වසර ගණනාවකට පෙර එකඟතා ලිපි හා වෙනත් අන්‍යොන්‍ය අවබෝධතා ගිවිසුම් මත ඉඩම් දේපළ ලබා දී ඇත. අදාළ ගොඩනැගිලි මීට වසර ගණනාවකට පෙර එනම් අධිකාරිය ආරම්භක දින සිට ලබා දී ඇති අතර, මේ වන විට අධිකාරිය මගින් වියදම් දරමින් මිනුම් කටයුතු සිදුකර අදාළ දේපළ පවරා ගැනීම සඳහා කටයුතු කරමින් ඇති අතර දේපළ ගණනාවක හිමිකම් මේ වන විටත් අධිකාරියට ලබාගෙන ඇත. | ඉඩම් අයිතිය කඩිනමින් අධිකාරියට පවරාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) සමාලෝචිත වර්ෂයේ රු. 5,089,972 ක් වූ පොලී ආදායම මත ගෙවිය යුතු රු. 1,221,593 ක ආදායම් බදු වගකීම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත උපයන ආදායම් මත බදු ගෙවීමට ආදායම්කරු වගකිව යුතු වුව ද රාජ්‍ය ආයතනයක් ලෙස (භාණ්ඩාගාර යෙදවුම් මත යැපෙන ) අප ආයතනය තුළින් උපයන ආදායම් ක්‍රමවේද නොමැති හෙයින් ද බදුගෙවීමක් මෙතෙක් සිදුකර නොමැත. එහෙත් ඔබගේ නිර්දේශ පරිදි පොලී ආදායම මත බදු ගෙවීම ඉදිරියේ දී එනම් 2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරනු ඇත. | පොලී ආදායම මත ගෙවිය යුතු ආදායම් බදු මුදල් ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) 2019 හා 2020 වර්ෂවල තේ වගාව සඳහා ග්ලයිෆොසෙට් බෙදාහැරීමට අදාළව විවිධ වියදම් යටතේ වෙන්කර තිබුණු ප්‍රතිපාදන මුදලින් ඉතිරි වී තිබුණු රු. 3,980,066 ක් සහ තේ වගාවේ පාංශු සංරක්ෂණය සඳහා ගොවීන් වෙත බෙදා දුන් ආධාර මුදලින් අදාළ චෙක්පත් නිරවුල් කර නොගත් වටිනාකම වශයෙන් රු.3,937,038 ක් 2014 වර්ෂයේ සිට වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණු අතර අදාළ කාර්යය අවසානයේ ගිණුම්වලින් නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි. | ග්ලයිෆොසෙට් බෙදාහැරීමට අදාළ වියදම් යටතේ ඉතිරි මුදල් ප්‍රමාණය හා පාංශු සංරක්ෂණ සහනාධාර ලෙස ගොවීන් වෙත බෙදා දී ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ ප්‍රමාණයන්ද මූල්‍ය ප්‍රකාශන තුළ වගකීම් යටතේ පෙන්නුම් කර ඇති බවට එකඟ වෙමි. එම මුදල් ප්‍රමාණය ඉදිරියේ දී කුඩා තේ වතු හිමියන්ගේ අභිවෘද්ධිය පිණිස ව්‍යාපෘතියක් සකස් කර අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව භාණ්ඩාගාරයේ අනුමැතිය මත වැය කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාළ කාර්යය අවසානයේ ඉතිරි ප්‍රතිපාදන භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හෝ භාණ්ඩාගාර අනුමැතිය යටතේ අදාළ වියදම් දැරීම කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

සියලුම නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා සම්බන්ධ නිරීක්ෂණ මේ යටතේ දැක්විය හැකිය.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) විවිධ තොග | **11,353,013** | **4,014,660** | **7,338,353** | විවිධ තොග ගිණුමේ ශේෂය භෞතික ශේෂය අතර පරස්පරතාවයක් හඳුනාගන්නා ලදී. ඒ අනුව ගැලපුම් වාර්තාවක් සකස් කරන ලදී. හඳුනාගත් වෙනසට හේතූන් 2022 මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කරන බව දන්වමි. | තොග ශේෂය නිවැරදිව ගැලපීම් කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ)ප්‍රාදේශීය කාර්යාලවල ණයගැති ශේෂ | **7,312,558** | **2,734,862** | **4,577,696** | මින් ඉදිරියට සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම වෙන් වෙන් වශයෙන් ණයගැති ශේෂයන් සලකුණු කිරීම සඳහා ලිඛිත උපදෙස් ලබා දී ඇත. | ප්‍රාදේශීය කාර්යාලවල ණයගැති ශේෂයන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදිව ගැලපුම් කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)1998 වර්ෂයේ පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි ලබා ගැනීම සඳහා කුඩා තේ වතු සමිතිවලට ලබා දී තිබුණු ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු ණය ශේෂය වූ රු. 4,374,289 ක් වර්ෂ 22 ක් ගත වී තිබුණද අයකර ගැනීමට ඵලදායි පියවරක් ගෙන නොතිබුණි. | 1998 වර්ෂය තෙක් ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රම යටතේ කුඩා තේ වතු සමිති වෙත නිකුත් කළ පොහොර, දියර ඉසින හා තරාදි වෙනුවෙන් අයවිය යුතු ප්‍රමාණයන්ගෙන් සමථ මණ්ඩල වෙත යොමු කර අයකර තව දුරටත් අයවීමට ඉතිරි ප්‍රමාණය රු.4,374,289 කි. තවදුරටත් අයකර ගත නොහැකි වර්ෂ 22ක් පැරණි ණය ලියාහැරීමට අනුමැතියට යොමු කළ | වගකිව යුතු පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ණය ශේෂයන් අයකර ගැනීමට පියවරගත යුතුය. |

| | | |
|---|---|---|
| | ද අනුමත කර ගත නොහැකි වූ බව දන්වමි. | |
| (ආ)1998 වර්ෂයේ වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩසටහන මඟින් පෞද්ගලික තේ කම්හල් හතරකට ලබාදී තිබුණු රු.5,916,589 ක ණය මුදල් 2016 වර්ෂයේ සිට 2021 වර්ෂය අවසාන වන තෙක් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. ඊරියගහ කම්හලට පමණක් ණය අයකර ගැනීමට නෛතික ක්‍රියාමාර්ග ගෙන ඇති බව නිරීක්ෂණය විය. | 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම වෙනුවෙන් වර්ණ විභේදන යන්ත්‍ර ණය පදනමින් ලබා දී ඇත. ඒ අතරින් කම්හල් 04 කින් තවදුරටත් අයවිය යුතු මුදල් අතරින් ඊරියගහ කම්හලින් අයවිය යුතු මුදල් වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග තුළින් රු. 2,436,448 ක් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. එසේම ගාල්ල සමූපාකාර සමිතියේ වත්කම් ඇවර කිරීමෙන් අනතුරුව වගකීම් නිදහස් කිරීමේ දී අධිකාරියට මුදල් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන බව දන්වා ඇත. ඉතිරි තේ කම්හල් 2 වසා දැමීම හේතුවෙන් මුදල් අයකර ගැනීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති බව දන්වමි. | ණය අයකරගැනීම සඳහා කඩිනමින් අවශ්‍ය පියවර ගත යුතු අතර වසා දමන ලද කම්හල් සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් මඟින් තව දුරටත් පරීක්ෂා කර සුදුසු තීරණයකට එළඹිය යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා 1998 වර්ෂයේදී ණය පදනම යටතේ ලබාදී තිබුණු වාහන 23 ක් විකිණීමෙන් ලැබී තිබුණු රු. 9,155,483 ක මුදල හා පස සංරක්ෂණය වෙනුවෙන් අධිකාරිය විසින් 2020 වර්ෂයේ දී නුවරඑළිය හා රත්නපුර යන ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්හී ගොවීන්ට සහනාධාර දීමනාවක් ගෙවීමට ලබාදී තිබුණු මුදලින් ඉතිරි රු. 13,812,613 ක් 2021 වර්ෂය අවසානය වන විටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | අධිකාරිය සතු වාහන 26 න් 18 ක්ම වසර 20 කට වඩා පැරණි වාහන වේ. එබැවින් මෙම මුදල යොදවා වාහන මිලදී ගැනීමට භාණ්ඩාගාර අනුමැතිය සඳහා යොමු කර ඇත. පාංශු සංරක්ෂණ සහනාධාර ගෙවීම අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම තුළ පැවති ක්‍රියාකාරකම් නිසාවෙන් මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීමක් සිදු නොවේ. එම මුදල් ඉදිරියේ දී සහනාධාර ගෙවීම සඳහා යොදා ගැනීම සිදු වන බව දන්වා සිටිමි. | ඉතිරි මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු අතර භාණ්ඩාගාර අනුමැතියකින් තොරව එම මුදල් වියදම් නොකළ යුතුය. |
| (ආ) 2016 වර්ෂයේ රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයේ තේ ගොවීන් වෙත පොහොර ආධාර වෙනුවෙන් නිකුත් කළ චෙක්පත් වලින් හිමිකම් නොපෑ චෙක්පත් වටිනාකම වූ රු. 4,972,951 ක් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමි යටතේ ගෙවිය යුතු ශේෂයන් වශයෙන් දක්වා තිබුණු අතර ආධාර සඳහා හිමිකම් | වර්ෂ 2016 සිට 2018 දක්වා ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි. මෙහි මුදල් යෙදවුම රු.මිලියන 4429 කි. ඉන් හිමිකම් නොපෑ මුදලේ වටිනාකම සියයට 0.1 පමණි. රාජ්‍ය භාණ්ඩාගාරය තුළින්ම මෙය වියදමක් ලෙස ගිණුම්ගත කර ඇති හෙයින් කුඩා තේ වතු හිමියන් වෙත විශේෂ | භාණ්ඩාගාරයෙන් ලද මුදල් වල ඉතිරිය නැවත භාණ්ඩාගාරයට ප්‍රේෂණය කිරීම හෝ භාණ්ඩාගාර අවසරය මත වෙනත් කාර්යකට |

| | | | |
|---|---|---|---|
| නොපැමට හේතු සොයාබලා මෙම ශේෂ නිරවුල් කිරීම වසර 05 ක් තිස්සේ ප්‍රමාද කර තිබුණි. | ව්‍යාපෘතියක් සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත භාණ්ඩාගාරයට දැනුම් දී වියදම් කිරීමට කටයුතු කරනු ඇත. | උපයෝජනය කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ මු.රෙ . 371(2) (ආ) | කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිමයක් ලබා දීමට හැකි අතර එම උපරිම මුදල ඉක්මවා අවස්ථා 5 කදී රු. 710,000 ක් අග්‍රිම ලෙස ලබා දී තිබුණි. | සීමිත මාණ්ඩලික නිලධාරීන් කණ්ඩායමක් සමඟ කටයුතු කිරීමේදී රු.210,000 ක මුදලකින් උපරිම සීමාව ඉක්මවා යාමක් සිදුව ඇති බව දන්වමි. ඉදිරියේ දී මු.රෙ 371(2) (ආ) පරිදි උපරිම සීමාව තුළ කටයුතු කිරීමට සටහන් කර ගතිමි. | මුදල් රෙගුලාසි විධිවිධානවලට අනුකූලව අත්තිකාරම් ලබා දිය යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ | | | |
| (i) VII පරිච්ඡේදයේ 12.3 වගන්තිය | නිත්‍ය තනතුරක් දරන්නකු රාජකාරී ඉටු කිරීමට පත්කළ හොත් ගෙවිය යුත්තේ ඔහු එම තනතුරට වැඩ බැලීමට පත්කරනු ලැබුවේ නම් ඔහුට ලැබෙන අතිරේක පාරිශ්‍රමිකයෙන් 2/3 ක් වුවත් ඊට පටහැනිව තනතුරු 03 ක රාජකාරී ඉටු කිරීමේ දීමනා වශයෙන් අදාළ තනතුරෙහි ආරම්භක වැටුපෙන් 1/4 ක දීමනාවක් ගෙවා තිබුණි. | මෙම අයට දීමනා ගෙවීම සම්බන්ධව අභ්‍යන්තර විගණන පරීක්ෂණයකින් අනතුරුව ලබාදුන් නිර්දේශ මත විගණන හා කළමනාකරණ කමිටුව වෙත කරුණු වාර්තා කර ඇත. එම කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අනුමැතිය සඳහා යොමු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රාජකාරී ඉටු කිරීමේ දීමනා ගෙවීම් කළ යුතුය. |
| (ii) 11 පරිච්ඡේදයේ 13.7 වගන්තිය | පුරප්පාඩු වූ තනතුරක රාජකාරී ආවරණය කරන නිලධාරියාට අතිරේක පාරිශ්‍රමිකයක් ලබාගැනීමට හිමිකමක් නොමැති වුවද, | උක්ත දීමනාව නිලධාරියා රාජකාරී ආවරණයට පත්කර ගෙවනු ලැබූ අතිරේක පාරිශ්‍රමිකයක් | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව රාජකාරී ආවරණය සඳහා |

| | | | |
|---|---|---|---|
| | හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානයේ කළමනාකරු (පුහුණු) තනතුරේ රාජකාරි කටයුතු ආවරණය සඳහා එවකට නුවරඑළිය ප්‍රාදේශීය කළමනාකරු 2016 නොවැම්බර් 01 දින සිට පත්කර එම රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් ඔහු වෙත මධ්‍යස්ථානය ලැබූ ලාභයෙන් රු.111,290 ක දීමනාවක් 2018 අප්‍රේල් 06 දින ගෙවා තිබුණි. | නොවන බවත් හුදෙක් නිලධාරියා දිරිමත් කර ඇගයීම සඳහා ගෙවන ලද දිරිදීමනාවක් පමණක් වන බවත් කාරුණිකව පෙන්වා දෙමි. | ගෙවීම් කළ නොහැකි අතර භාණ්ඩාගාරයේ අනුමැතිය මත පමණක් වෙනත් දීමනා ගෙවීම් කළ යුතුය. |
| (ඈ) අංක පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 150 කට පසු විගණිත ගිණුම් සමඟ විගණකාධිපති වාර්තා භාෂාත්‍රයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කළ යුතු වුවත්, 2019 සහ 2020 යන වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තාවන් විගණිත දින දක්වා සභාගත කර නොතිබුණි. | 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2022.03.24 දින හා 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2022.06.16 දින ත්‍රිත්ව භාෂාවෙන්ම මුද්‍රණය වෙත යොමු කර ඇත. | ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් තුළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |
| (ඇ) අංක පීඊඩී1/ 2015 හා 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2.2 ඡේදය | මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හීදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව දරන ලද අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ හැකි වුවද, අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා විසින් 2020 වර්ෂයේ සිට 2022 මැයි 26 දක්වා ලබා ගෙන ඇති එකතුව රු.516,773 ක අමතර ඉන්ධන දීමනාව සඳොස් ලෙස සභාපතිගේ අනුමැතිය යටතේ ප්‍රතිපූරණය කරගෙන තිබුණි. | 2017.08.01 පැවති 541 ක් වන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට තීරණය ලෙස ඉදිරියේ දී සාමාන්‍යාධිකාරි අතිරේක ඉන්ධන අධිකාරියේ සභාපතිතුමා හට යොමු කොට එම අනුමැතිය මත වියදම් ප්‍රතිපූර්ණය කරන ලෙස දන්වා ඇත. ඒ අනුව සාමාන්‍යාධිකාරිතුමා ගේ නිල වාහන සඳහා අතිරේක ඉන්ධන දීමනා අධිකාරියේ සභාපතිතුමාගේ අනුමැතිය යටතේ ප්‍රතිපූර්ණය කර ඇති බව දන්වමි. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව අමතර ඉන්ධන වියදම් ප්‍රතිපූර්ණය කළ යුතුය. |

## 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විවිධ ණයහිමි ශේෂය තුළ ඇතුළත් ගංවතුර ආධාර ගෙවීම සඳහා 2017 වර්ෂයේ වැවිලි අමාත්‍යාංශයෙන් අධිකාරිය වෙත ලබා දී තිබුණු මුදලින් ඉතිරි වූ රු. 9,485,310 ක් අදාළ පරිදි ආපසු යැවීමට හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය මත වෙනත් වියදම් දැරීමට කටයුතු නොකර ඉල්ලුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | 2017 වර්ෂයේ ගංවතුර ආපදාවට ලක් වූ ඉඩම් වෙනුවෙන් ලබා දුන් සහනාධාර ගෙවීම් කර ඉතිරි වූ මුදල්, අමාත්‍යාංශයට දැනුම් දී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත නැවත වගා , අලුත් වගා සහ පාලු සහනාධාර වෙනුවෙන් ගෙවීම් කර ඇත. එබැවින් ගිණුම්තුළ සටහන්ව තිබූ රු.9,485,310 ක මුදල නාමික වටිනාකමක් පමණක් වන අතර අදාළ වර්ෂයේ දී ගැලපීම් සටහන් සිදු නොවීම මත ගිණුම්තුළ පෙන්නුම් කළ ශේෂයකි. ඒ අනුව 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළින් නිවැරදි ලෙස ගැලපුම් කිරීමට සටහන් කර ගත් බව දන්වමි. | සහනාධාර සහ ව්‍යාප්ති කටයුතු වෙනුවෙන් ලැබී ඉතිරි වූ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතුය. එම මුදල් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වියදම් නොකළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ගැලපීමටද කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 171,795,953 අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 406,018,644 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 234,222,691 පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට විවිධ ආදායම් රු. 15,658,009 කින් අඩුවී තිබීමත් සංවර්ධන වියදම් රු.423,950,805 කින් වැඩිවී තිබීමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන කටයුතු සඳහා ලද රජයේ ප්‍රදාන සියයට 27 කින් වැඩිවී, විවිධ ආදායම් සියයට 82 කින් අඩුවී තිබුණි. සහනාධාර, ව්‍යාපෘති හා උපදේශන සේවා ඇතුළු ආයතනික සංවර්ධන වියදම් සහ අලුත්වැඩියා හා නඩත්තු වියදම් පිළිවෙලින් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 56 කින් හා සියයට 37 කින් වැඩිවීම තවදුරටත් නිරීක්ෂණය විය.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය පිළිවෙලින් 1.64:1 ක් හා 1.79: 1 ක් වූ අතර ක්ෂණික වත්කම් අනුපාතය පිලිවෙලින් 1.3: 1 ක් හා 1.27: 1 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික ප්‍රතිපත්තියට අනුව, උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වාගැනීම සඳහා වසරකට සියයට 02 ක් එනම් හෙක්ටයාර් 2,300 ක් තේ නැවත වගාව සිදුකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට අනුව තේ නැවත වගාව සඳහා ඉලක්ක ගත භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර් 1000 න් නැවත වගා කළ භූමි ප්‍රමාණය හෙක්ටයාර් 849 ක් පමණක් බව වාර්ෂික වාර්තාව අනුව තහවුරු විය. | තේ නැවත වගාවේ පැල සිටුවීමේ වාරිකයේ ඉලක්ක පිහිටුවීම 2019 හා 2020 වර්ෂ වල තේ නැවත වගාවේ බිම් සැකසීම අවසන් කර ඇති බිම් ප්‍රමාණය පාදක කර ගනිමින් සිදුකරනු ලැබේ. ඒ අනුව 2019 වර්ෂයේ බිම් සැකසීම හෙක්ටයාර් 376 ක් ද, 2020 වර්ෂයේ බිම් සැකසීම හෙක්ටයාර් 682 ක් ද වශයෙන් ඉටුකර ඇත. ඒ අනුව 2021 වර්ෂයේ පැල සිටුවීමේ වාරිකයට හෙක්ටයාර් 1058 ක බිම් ප්‍රමාණයක විභවයක් පවතී. එම ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1000 ක ඉලක්කයක් 2021 වර්ෂයේ තේ නැවත වගාව යටතේ පැළ සිටුවීම සඳහා ඉලක්කගත කර ඇත. හෙක්ටයාර් 151 ක ප්‍රමාණයක ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි වී ඇත .එහෙත් 2022 වර්ෂයේ මුල් භාගයේ දී මෙම ඉඩම් පරීක්ෂා කර අදාළ ගෙවීම් කටයුතු ද දැනට සිදුකරමින් පවතී. | ජාතික ප්‍රතිපත්තියට අනුව තේ නැවත වගා ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) අධිකාරියේ 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා පරිගණකගත තොරතුරුවලට අනුව හෙක්ටයාර් 996 ක තේ ඉඩම් සඳහා තේ නැවත වගා සහනාධාර පළමු වාරිකය ගෙවා තිබුණ ද තෙවන වාරිකය ලබා ගෙන තිබුණේ තේ ඉඩම් හෙක්ටයාර් 833 ක් පමණක් වන අතර දෙවන වාරිකය හා තෙවන වාරිකය ලබා නොගත් ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 163 ක් වේ. ඒ අනුව 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා තේ නැවත වගා සහනාධාර වියදම රු. 2,049,289,862 ක් වී තිබුණු අතර අනාර්ථික සහනාධාර බවට පත් ප්‍රමාණය රු. 295,145, 566 කි. ඒ අනුව මුළු සහනාධාර මුදලින් සියයට 14.4 ක් අරමුණට යොදවා නොමැති බව නිරීක්ෂණය විය. එමෙන්ම මෙම සහනාධාරලාභින් තේ වගාව සඳහා | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයේදී තේ නැවත වගා පළමු සහනාධාර වාරිකය ගෙවා ඇත්තේ හෙක්ටයාර් 996 ක් ලෙස සඳහන් කළ ද එම ප්‍රමාණය හෙක්ටයාර් 4892.34 කි . කෙසේ වුවද කිසියම් වර්ෂයකදී මෙම බිම් සැකසීම අවසන් කරන බිම් ප්‍රමාණයෙන් සියයට 80 ක් පමණ තේ නැවත වගාව සඳහා යොමුවන බව පසුගිය වසරවල දත්ත විශ්ලේෂණය කිරීමෙන් පැහැදිලි වේ. | මෙම සහනාධාර ලාභීන් තේ වගාව සඳහා යොමු කර ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| යොමු කර ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | | |
| (ඇ)පුරප්පාඩු වූ ප්‍රාදේශීය කළමනාකරු තනතුරු 04 ක් පිරවීම සඳහා 2019 සහ 2020 වර්ෂයන්හි අවස්ථා තුනකදී අයදුම්පත්‍ර කැඳවා තිබුණද, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලකුණු ලබාදීම නිවැරදිව සිදු කර නොමැති වීම, අයදුම්පත් කැඳවා මාස 06 කට වැඩි කාලයක් ගත වීම වැනි කරුණු හේතුවෙන් බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකිව තිබුණි. එසේ වුවද, නැවතත් 2021 අගෝස්තු 04 දින පැවති සම්මුඛ පරීක්ෂණයෙන් ප්‍රාදේශීය කළමනාකරු තනතුරට උසස් කිරීමට නිර්දේශිත නාමයන් සඳහා රාජ්‍ය අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගැනීමට 2021 අගෝස්තු 09 දින ඉදිරිපත් කර තිබුණද, අධ්‍යක්ෂ මණ්ඩල තීරණය ඉදිරිපත් නොකිරීම, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සමාජිකයන් දින රහිතව අත්සන් කර තිබීම හෝ අත්සන් කර නොතිබීම යනාදී කරුණු හේතුවෙන් නැවත වාර්තා කැඳවා තිබුණු අතර පත්කිරීම් සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශ අනුමැතිය ලැබී තිබුණේ 2021 නොවැම්බර් 05 දින වුවද අමාත්‍යාංශ අනුමැතිය ලැබීමට ප්‍රථම එනම් 2021 අගෝස්තු 09 දින සිට පත්වීම් ලබා දී තිබුණි. | අනුමත කරන ලද සංශෝධිත බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව ප්‍රාදේශීය කළමනාකරු තනතුර සඳහා අභ්‍යන්තර නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට කටයුතු කරන ලදි. අමාත්‍යාංශය මගින් විධිමත් පරීක්ෂණයක් සිදුකරන තෙක් අධිකාරිය මගින් වාර්තාවක් කැඳවමින් 2019.08.06 සම්මුඛ පරීක්ෂණය මණ්ඩලයේ නිර්දේශ මත බඳවා ගැනීම් සිදුකිරීම තාවකාලිකව අත්හිටුවන ලදි. 2020.08.17 දින කැඳවන ලද අයදුම්පත්වලට අදාළව සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අවස්ථා තුනෙහිදීම කටයුතු සූදානම් කරන ලද මුත් නොවැලක්විය හැකි හේතූන් මත එම අවස්ථා තුනෙහිදීම සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට නොහැකි විය.<br>ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම බඳවා ගැනීම් සිදුකිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වෙත 2021.08.06 දින පූර්ව දැනුවත් කිරීමක් සිදුකිරීමෙන් අනතුරුව ඊළඟ ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩලය (2021.08.20) වෙත මණ්ඩල පත්‍රිකාවක් මගින් යොමුකර 2021.11.05 දින අනුමැතිය ලබා දී ඇත. | බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධානයන්ට අනුකූලව සහ අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමෙන් පසු කිසිවෙකුටත් අගතියක් නොවන පරිදි උසස්වීම් ලබා දිය යුතුය. |
| (ඈ) ප්‍රාදේශිය කළමනාකරු තනතුරු 04 හි පුරප්පාඩු පිරවීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේදී අතිරේක අධ්‍යාපන සුදුසුකම් යටතේ පුද්ගලික ලිපිගොනුවේ ඇතුළත් කර නොතිබුණු දැනටත් ආයතනය සතුව නොපැවතුන සහතික පත්‍ර සඳහා ලකුණු ලබාදී තිබුණි. | සම්මුඛ පරීක්ෂණයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සහතිකපත් ලේඛන පදනම්ව ලකුණු ලබා දී ඇත. | අපේක්ෂකයන්ට ලකුණු ලබාදීම සඳහා පාදක කරගත් සහතික ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල බහා තැබිය යුතුය. |
| (ඉ)2022 ජනවාරි 26 දින සිදු කළ භෞතික පරීක්ෂාවේදී, 2019 වර්ෂයේ ඉදිකිරීම් නිම කළ වටිනාකම රු. 11,213,888 ක් වූ හන්තාන රත්නසිරි වික්‍රමනායක | හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ පැති කාණුවේ කොන්ක්‍රීට් යෙදීම 2019 වසරේ සිදුකර ඇත. අදාළ කොන්ක්‍රීට් යෙදවුම් කාණුව මතුපිට | ප්‍රමිතියට අනුකූලව ඉදිකිරීම් සිදු කර තිබේද යන්න පරීක්ෂා කර |

| | | |
|---|---|---|
| ජාතික පුහුණු මධ්‍යස්ථානයේ පිවිසුම් මාර්ගය, දෙපස පැති බැම්ම හා පැති කාණුවල යොදා තිබුණු කොන්ක්‍රීට් යෙදවුමෙ කැඩීම් සහ පිපිරුම් නිරීක්ෂණය විය. | වැසීම සඳහා යොදා ඇති අතර, පෙරනිම් කොන්ක්‍රීට් යම් කාලයක් ගතවීමෙන් පසු සියුම් ඉරිතැලීම් හා පිපිරුම්වලට ලක්විය හැකි අතර එය සාමාන්‍ය තත්ත්වයක් වන බැවින් කම්බි යොදා වැරගන්වා ඇති බැවින් අනතුරුදායක තත්ත්වයක් ඇති නොවේ. | තහවුරු කර ගත යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නැවත වගාව, අලුත් වගාව සහ පාළු වගාව ඇතුළු සමස්ත වගා සහනාධාර සඳහා 2017 සිට 2019 දක්වා සෑම වර්ෂයකම රු. මිලියන 500 ට වැඩි මුදලක්ද පසුගිය වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.737,542,872 ක් හා රු. 1,030,214,720 ක් ලබා දී තිබුණු අතර නිම් තේ නිෂ්පාදනයේ ජාතික නිෂ්පාදන දායකත්වය 2017 වර්ෂයේදී සියයට 75.5 සිට 2021 දී සියයට 74.56 දක්වා පහළ ගොස් ඇති බව වාර්ෂික වාර්තාව අනුව නිරීක්ෂණය විය. | තේ නැවත වගාව/අළුත් වගාව හා පාළු වගා වැඩ සටහන සඳහා සහනාධාර වශයෙන් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 40 ක මුදලක් ලබාදීම සිදුකර ඇත. එහෙත් සමාලෝචිත වර්ෂයේදී ජාතික තේ නිෂ්පාදනයේ දායකත්වයෙන් සියයට 73.85 සිට සියයට 74.56 දක්වා සියයට 0.76 කින් වර්ධනය වී ඇති බව දන්වා ඇත.ඉහත දක්වා ඇති සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී එම ආයෝජන වලට අදාළව තේ දලු නිෂ්පාදනය වර්ධනය වීම 2026 හා 2027 වර්ෂ වල සිට ආරම්භ වනු ඇත. | නැවත වගාව, අලුත් වගාව සහ පාළු වගාව ඇතුළු සමස්ත වගා සහනාධාර උපයෝජනය කාර්යක්ෂම හා ඵලදායී විය යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිම් තේ කිලෝ ග්‍රෑම් 1,241 ක් වු අතර එය 2018 වර්ෂයේ කිලෝ ග්‍රෑම් 1,958 ක් ව පැවැති අතර 2018 වර්ෂයේ සිට සාමාන්‍ය ඵලදායිතාවය ක්‍රමිකව පහත යමින් පැවතුණි. කුඩා තේ ඉඩම් වල ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ව්‍යාප්ති හා උපදේශක සේවා සඳහා වාර්ෂිකව විශාල මුදලක් වැය කර තිබුණද ඉන් අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වී නොතිබුණි. එමෙන්ම 2021 කෙටුම්පත් වාර්ෂික වාර්තාව අනුව ඵලදායි ව්‍යාප්ති සේවාවක් සඳහා තිබිය යුතු ව්‍යාප්ති නිලධාරි හා තේ ගොවි අනුපාතිකය 1:1000 ක් වුවද 2021 වර්ෂයේ කුඩා තේ වතු අංශයේ ව්‍යාප්ති නිලධාරි හා තේ ගොවි අනුපාතිකය 1:3210 ක් වී තිබුණි. | 2005 වර්ෂයෙන් පසුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමක් යටතේ තේ ඉඩම් සංගණනයක් සිදුව නොමැත. නමුත් තේ මණ්ඩලය 2018 සිදු කරන ලද තේ ඉඩම් ලියාපදිංචියට අනුව මෙතෙක් හදුනාගෙන තිබූ තේ වගා කළ භූමි ප්‍රමාණය විශාල ලෙස වැඩිවීම මත භූමි ඵලදායීතාව අඩුවී ඇති බව දන්වා සිටිමි. | කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය වැඩිකර ගැනීමට ව්‍යාප්ති හා උපදේශන සේවාවන් පුළුල් කළ යුතු අතර මානව සම්පත් උපයෝජනය ප්‍රශස්ත මට්ටමකින් පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන ආයතනික තේ තවාන් අවම වශයෙන් නිෂ්පාදනය සඳහා දැරූ වියදම හෝ ආවරණය කරගත යුතු බව අධිකාරිය විසින් පිළියෙල කර තිබූ තේ තවාන් කළමණාකරන උපදෙස් මාලාවෙහි හැඳින්වීමේ ඡේදයෙහි අවධාරණය කර තිබුණද මාවරල, නෙල්ලිගොල්ල, වෝගන් හා හැඩිගල්ල යන තවාන්වල ආදායම, වියදම් පියවා ගැනීමට හෝ ප්‍රමාණවත් වී නොතිබුණි. තවාන් කළමනාකරණ උපදෙස් මාලාවේ අංක 4.2 වගන්තිය ප්‍රකාරව තේ තවාන්වල තේ පැළ මියයාමේ ප්‍රතිශතය සියයට 10 කට අඩු මට්ටමකට පවත්වාගත යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දිනට නෙල්ලිගොල්ල හා වලහන්දුව තේ තවාන්වල පැළ විනාශවීමේ ප්‍රතිශතය සියයට 17 ක් ව පැවතුණි. | කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය තේ තවාන් පවත්වාගෙන යනු ලබන්නේ ලාභ ඉපයීමේ ව්‍යාපාරික අරමුණින් නොවන බවත් හුදෙක් තේ කර්මාන්තයේ තිරසර පැවැත්මට අවශ්‍ය ගුණාත්මක පැළ නිශ්පාදනයයි. සම්මත පැළ මිය යාමේ ප්‍රතිශතය සියයට 10 වුව ද විවිධ පාලනයකින් තොර හා පාලිත හේතූන් මත පැළ මිය යාම ඉහළ යා හැක. එවන් අවස්ථාවලදී මෙන්ම තවාන් සම්න්ධ කටයුතු කිරීමේ දී මනා අධීක්ෂණයකින් හා අවධානයකින් කටයුතු කරයි. කිසියම් අවස්ථාවක අනවධානයෙන් හෝ සේවක දුර්වලතාවක් මත ආයතනික තවාන් පාඩු ලබන්නේ නම් ඒ පිළිබඳ විනයානුකූල හා නෛතිකව කටයුතු කරන බව දන්වමි. | තවාන් කළමනාකරණ උපදෙස් මාලාවට අනුගත විය යුතු අතර නව විකල්ප සැලසුම් මඟින් පැළ මියයාමේ ප්‍රතිශතය අඩු මට්ටමකින් පවත්වා ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඈ)කුඩා තේවතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම, පාලනය කිරීම හා සමිතිවල සාමාජිකයින්ට ආධාර ලබාදීම අධිකාරියේ කාර්යභාරයක් වන අතර සමාලෝචිත වර්ෂයේද ඒ සඳහා රු.2,076,761 ක් වැය කර තිබුණි. 2021 වාර්ෂික වාර්තාවට අනුව 2019 වර්ෂයේ පැවති සමිති සංඛ්‍යාව 1,475 සිට 2021 වර්ෂයේදී 1,484 ක් දක්වා වැඩිවී තිබුණද සමිති සාමාජික සංඛ්‍යාව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පිළිවෙලින් 329,963 සිට 279,594 දක්වා 50,369 කින් එනම් සියයට 15 කින් අඩුවී තිබුණි. | 2018 වර්ෂයේ සිට සමිති සංඛ්‍යාව වැඩිවෙමින් පැවැතුනද 2020 වර්ෂයේ මුල් කාර්තුවේ පැවති අධික නියං තත්වය හා මේ දක්වා පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල පැවැති සංචරණ සීමාවන්,පොහොර, කෘෂි රසායන වැනි යෙදවුම් මිල අධික ලෙස ඉහළයාම හේතුවෙන් ආර්ථීක හා සමාජ ආතතීන් සහ ව්‍යවස්ථාව මගින් නියම කරන ලද වාර්ෂික සමිති සාමාජික ගාස්තුව සමිතියට නොගෙවීමෙන් සාමාජිකත්වයේ අඩුවක් පෙන්නුම්කිරීම වැනි කරුණු හේතුවෙන් මේ වන විට සමිති ක්‍රියාකාරිත්වය දුර්වලවීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කරන බව නිරීක්ෂණය වේ. | කුඩා තේවතු සංවර්ධන සමිතිවල ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ප්‍රතිපාදන මගින් 2020 වර්ෂයේ ආරම්භ කළ තේ පැළ මිලියන 25 විශේෂ ව්‍යාපෘතියෙන්, තේ ක්ෂේත්‍රයේ ගුණාත්මක හා ප්‍රමිතිගත රිකිළි තේ පැළ නිෂ්පාදනය සඳහා තවාන්කරුවන් පෙළඹවීම අපේක්ෂාව විය. ඒ අනුව තේ පැළ ධාරිතාවය 25,000 ක් වන පැළ නිෂ්පාදන තවාන්කරුවන් සඳහා රු. 100,000 ක් හා වෙනත් දීමනාද, තේ පැළ ධාරිතාවය 50,000 ක් වන පැළ නිෂ්පාදන තවාන්කරුවන් සඳහා රු. | තේ පැළ මිලියන 25 විශේෂ ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලද තවාන්කරුවන් අතුරින් ප්‍රතිලාභ ලබාදී ක්‍රියාකාරී නොවූ තවාන්කරුවන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රාදේශීය කලමනාකරුවන් වෙත උපදෙස් ලබා දී ඇත. මේ සඳහා ප්‍රාදේශීය කලමනාකරුවන් විසින් කටයුතු කරමින් පවතින අතර, එසේ ආපසු ලබා ගන්නා ලද මූල්‍යාධාර හා ද්‍රව්‍යාධාර සඳහා නව තවාන්කරුවන් | සුදුසු තවාන්කරුවන් සඳහා ප්‍රතිලාභ ලබාදීම සහ අධීක්ෂණ මට්ටම ඉහළ නැංවීම තුළින් ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීමට මගපෙන්වීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| 200,000 ක් හා වෙනත් දීමනාද ලබා දී තිබුණි. කෙසේවුවද, 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තවාන් 781 කින් තවාන් 207 ක් එනම් සියයට 26 ක් ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබුණි. එමෙන්ම අවසන් පරීක්ෂාව සිදුකළ තවාන් සංඛ්‍යාව 82 කි. ඒ අනුව මූල්‍ය ආධාර හා ද්‍රව්‍ය ආධාර ලබාගත් තවාන්කරුවන් 781 දෙනෙකු අතරින් සාර්ථක පැළ තවාන් පවත්වාගෙන යනු ලබන තවාන් සංඛාව 82 ක් වන අතර එය මුළු තවාන් සංඛාවෙන් සියයට 10 ක් පමණි. | තෝරා ඔවුන් වෙත එම මූල්‍යාධාර හා ද්‍රව්‍යාධාර ලබා දීමට කටයුතු කරමින් පවතී. | |
| (ඊ) මහනුවර, ගාල්ල, මාතර ප්‍රාදේශීය කාර්යාලයට අදාළව රිකිලි තේ පැළ සඳහා ගෙවිය යුතු තැන්පත් වශයෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු. 1,643,614 ක් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති අතර ඒවා 2008 වර්ෂයේ සිට ගොවීන් විසින් කරන ලද තැන්පතු වේ. මේවා ගිණුමේ දීර්ඝකාලීනව ඉදිරියට ගෙන එන අතර මේවා ගොවීන් වෙත සුදුසු පරිදි ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මහනුවර , ගාල්ල හා මාතර කාර්යාල මගින් සහනාධාර මුදල් ගෙවීමේ දී පැල සඳහා මුදල් අඩු කර එම ප්‍රමාණයට පැල නිකුත් කල යුතුයි. එනමුත් තවාන් ධාරිතාව අනුව නිකුත් කළ යුතු ප්‍රමාණයන්ට අඩුවෙන් නිකුත් කිරිම හේතුවෙන් 2008 තවදුරටත් ගොවීන් වෙත ගෙවිය යුතු ප්‍රමාණයක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇත. 2022 වර්ෂයේ සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගෙවිය යුතු තැන්පත් සැසඳුම් කර නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (උ)කළුතර ප්‍රාදේශීය කාර්යාලයේ සේවකයකුට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට අය කර ගැනීමට නොහැකිව රු. 1,093,035 ක දේපළ ණය ශේෂයක් පවතින අතර අධිකාරිය විසින් නිවාස ණය ලබා දීමේදී ණය නිකුත් කිරිමට ප්‍රථම ණය ඉල්ලුම්කරුගෙන් රක්ෂණාවරණය ලබා නොගැනීම නිසා මෙම තත්ත්වය උද්ගත වී තිබුණි. එම ණයකරු 2014 ජනවාරි 03 දින මිය යාමෙන් පසු ණය අය කර ගැනිමට පෙර ඇටෝර්නි බලය අවලංගු කර ඔප්පුව ආපසු ලබා දීම සිදු කර ඇති අතර මෙම වරදට වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | අධිකාරියේ නිවාස ණය ක්‍රමය සේවකයින් විසින් ඇති කර ගත් චක්‍රිය අරමුදලක් මත ක්‍රියාත්මක වේ. ඒ අනුව, අධිකාරියේ සේවකයින් වෙත ලබා දී ඇති නිවාස ණය මුදල සේවකයා මිය යාමෙන් පසු රක්ෂණ සංස්ථාව විසින් නොගෙවීම මත සේවකයාට වන අගතිය වළක්වා ගැනීම සඳහා වෘත්තීය සමිති විසින් ඉල්ලුම් කරන ලදුව අදාල දේපලේ ඇටෝනි බලය සභාපතිවරයාගේ නියෝග මත නිදහස් කර ඇත. අදාල නිවාස ණය ක්‍රමවේදය සේවකයන් විසින් ඇති කර ගත් චක්‍රිය ක්‍රමවේදයක් යටතේ ක්‍රියාත්මක වන බැවින් රු. ලක්ෂ 20 ක් දක්වා වූ මුදලක් රජයේ නිවාස ණය ලබා දීමේ ක්‍රමවේදයන්ගෙන් බැහැරව ආයතනික චක්‍රලේඛනය මත ක්‍රියාත්මක වනු ලබයි. ඒ අනුව, මෙකී නිවාස ණය අරමුදල තුල රජයේ කිසිදු මුදලක් නොමැත. | දේපළ ණය අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය හා අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) උස් සෙවණ පැළ නිෂ්පාදන විශේෂ වැඩසටහන යටතේ 2021 වර්ෂය තුළ කුඩා තේ වතු හිමියන් වෙත උස් සෙවණ පැළ මිලියන 1.2 ක් නොමිලයේ බෙදාහැරීම සඳහා සැලසුම් කර තිබුණු අතර මේ සඳහා ප්‍රාදේශීය කාර්යාල වෙත රු. 20,000,000 ක් මුල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබුණි. කෙසේ වුවද රෝපණ ද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් බඳුන්ගත කරන ලද පැළ සංඛ්‍යාව 623,478 ක් පමණක් විය. එමෙන්ම ප්‍රතිපාදිත මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට රු.17,085,356 ක් උපයෝජනය කර නො තිබුණු අතර එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 85 කි. | පවතින දේශගුණික විපර්යාසයන්ට මුහුණ දීමට උස් සෙවන ස්ථාපිත කිරීමට කාලෝචිත මෙන්ම අත්‍යාවශ්‍ය වැඩසටහනක් ලෙස ක්‍රියාත්මක විය. ඒ අනුව වැඩසටහන සැලසුම් කළ අතර බීජ සැපයීම තේ පර්යේෂන ආයතනය භාර ගන්නා ලදී. නමුත් 2021 මැයි මස නැවත තේ පර්යේෂණ ආයතනය මෙම බීජ සැපයිය නොහැකි බව දැනුම් දෙන ලදී. ඒ අනුව එතැන් සිට රෝපණ ද්‍රව්‍ය ප්‍රාදේශිකව මිලදී ගෙන මාස් කන්නයේ දි බඳුන්ගත කිරීමට කටයුතු කළ අතර වර්ෂ අවසානය වන විට පැළ ලක්ෂ 8 ක් නිෂ්පාදන කිරීමට හැකි විය. ඒ අනුව 2022 යල කන්නයේ දී උස් සෙවන පැළ ප්‍රතිලාභීන් වෙත බෙදා දුන් බව දන්වා සිටිමි. | නිවැරදි හා තාත්වික සැලසුම් සකස් කළයුතු අතර ප්‍රතිපාදන ඵලදායීව හා කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමෘද්ධි හෝ අඩු ආදායම්ලාභී පවුල් දෙලක්ෂයක් කේන්ද්‍ර කර ගනිමින් අංග සම්පූර්ණ ගෘහ ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහනට සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මුල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් රු. මිලියන 50 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. කුඩා තේ වතු හිමියන්ගේ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා තේ වතු වගා කරන අඩු ආදායම්ලාභි ගොවීන් සඳහා කුකුළු පැටව් පාලනය, මී මැසි පාලනය, බිම්මල් වගාව සඳහා ද්‍රව්‍ය ආධාර ලබාදීම හා කුඩා තේ වතු සම්බන්ධ භූමි පරිභෝජනය ප්‍රශස්ත කිරීම සඳහා අතුරු බෝග පැළ ලබාදීම මූලික කාර්යයන් වුවද, අධිකාරියට ලැබී තිබුණු මුදලින් රු.16,502,442 ක් එනම් සියයට 33 ක් සමාලෝචිත වර්ෂය අවසානයට උපයෝජනය නොකර ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාල තුළ ඉතිරි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි.25 ක මුදලක් 2021 ඔක්තෝබර් මාසයේදී ද තවත් රු.මි. 25 ක මුදලක් 2021.12.16 දින ද සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් වතු ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණ හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ලබාදී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේදී මී මැසි පාලනය සඳහා මී මැසි පෙට්ටි ලබාදී ඇතත් මී මැසි ජනපද එම ප්‍රතිලාභීන් වෙත ලබාදීමට හැකියාව ඇත්තේ මසකට උපරිම ජනපද හයක් පමණි. එසේම කුකුල් පාලනය සඳහා යොමු වූ ප්‍රතිලාභීන් කුකුල් කූඩු සකස් කර ඒ සඳහා නියමිත මුදල් ලබාදී කුකුල් පැටවුන් ලබාදීමේදී එම පැටවුන් ඇණවුම් කර මාස එක හමාරක පමණ කාලයක් සැපයුම්කරුගේ ගොවිපලේ පෝෂණය කළ යුතුව ඇත.මෙම කරුණු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා මාස හයක පමණ | ව්‍යාපෘති මුදල් කාර්යක්ෂමව හා ඵලදායීව සැලසුම් ගත කාර්යයන්හි උපයෝජනයට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කාලයක් ගතවී ඇත. කෙසේ වුවද දැනට මෙම ව්‍යාපෘතිය සඳහා ලබාදෙන ලද සියලු මුදල් ගෙවා අවසන් කර ඇත. | |

## 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වාර්ෂික අයවැය යෝජනා අනුව ප්‍රතිපාදිත රු. මිලියන 250 ක මුදලින් වරින්වර වැව්ලි අමාත්‍යාංශය හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කුඩා තේ වතු හිමියන් වෙත බෙදා හැරීමට මිලදී ගත් රු. 97,596,842 ක් වටිනා වතුර මෝටර්, දියර ඉසින යන්ත්‍ර, මුල්ලු, උදළු, අලවංගු, කප්පාදු පිහි හා හෝස් බට යනාදී භාවිතයට නොගත් කෘෂි උපකරණ ඒකක 7658 ක් 2022 දෙසැම්බර් 27 දිනට ප්‍රධාන කාර්යාලයේ හා ප්‍රාදේශීය කාර්යාලවල ගබඩා කර තිබුණි. මෙම තොග අයිතමයන් දිගු කාලයක් භාවිතයට නොගෙන ගබඩාව තුළ රඳවා තබා ගැනීම නිසා එහි වගකීම් කාලය ඉක්මවා ගොස් තිබුණ අවස්ථාද නිරීක්ෂණය විය. | 2019 වර්ෂයේ අවසන් භාගයේ ජනාධිපතිවරණය හේතුවෙන් කෘෂි උපකරණ බෙදාදීම සිදු නොකල අතර, 2020 වර්ෂයේ මෙම කෘෂි උපකරණ බෙදාදීම සිදුකිරීමට කටයුතු කරන ලදි. එහෙත් රටේ පැවැති කොවිඩ් වසංගත තත්ත්වය හා සංචරණ සීමා හේතුවෙන් එම කෘෂි උපකරණ බෙදා අවසන් කිරීමට නොහැකි විය. අනතුරුව 2021.11.16 දිනැතිව සියලුම කෘෂි උපකරණ බෙදා අවසන් කිරීමට සභාපතිතුමාගේ අනුමැතිය පරිදි ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කරන ලදි. ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ වතුර මෝටර් 496 ක් හා දියර ඉසින යන්ත්‍ර 153 ක ප්‍රමාණයක් ඉතිරිව පවතී. එම කෘෂි උපකරණ ද 2022.08.31 දිනට ප්‍රථම ලබාගෙන කුඩා තේ වතු හිමියන් වෙත බෙදා හැරීමට කටයුතු කරන ලෙසට ප්‍රාදේශීය කාර්යාල දැනුවත් කර ඇත. | කඩිනමින් කෘෂි උපකරණ ගොවීන් වෙත බෙදාහැරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර මිලදී ගැනිම සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.8.4 වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් නොකර අධිකාරියේ කළමණාකරු (සංවර්ධන) විසින් ඉදිරිපත් කර තිබුණු පිරිවිතරයක් පාදක කර ගනිමින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය ආරම්භ කිරීම සඳහා කොම්පෝස්ට් අමුද්‍රව්‍ය කැබලි කිරීමේ යන්ත්‍ර 08 ක් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් සෘජු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.5 ආ වගන්තිය අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක අවශ්‍යතාවය පිළිබඳව දෙපාර්තමේන්තුවක ප්‍රධානියා විසින් තීරණය කළ යුතු බව සඳහන් වේ. යන්ත්‍රයක මූලික පිරිවිතරයන් කවරේද යන්න පිළිබඳව කොම්පෝස්ට් පොහොර, අධිකාරිය මගින් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන අංශයේ කළමනාකරු (සංවර්ධන) වෙතින් වඩා පහසුවෙන් නඩත්තු කර | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත් ක්‍රමය භාවිතා කර රු.2,300,000 කට 2021 ජූනි මස මිලදී ගෙන තිබුණි. මිලදී ගැනීමෙන් පසුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර තිබුණු අතර 2021 ඔක්තෝබර් 28 දින රැස්ව තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් මෙම ප්‍රසම්පාදනයට කිසිදු දායකත්වයක් ලබා දී නොතිබුණි. තවද ව්‍යාපෘතිය මඟින් ප්‍රාදේශීය කාර්යාල 08 වෙතින් නිෂ්පාදනයට අපේක්ෂිත කොම්පෝස්ට් පොහොර ප්‍රමාණය මාසිකව මෙ.ටොන් 05 ක් බැගින් මෙ.ටොන් 40 ක් ලෙස හඳුනාගෙන තිබුණද අවශ්‍යතාවයට සරිලන සහ ප්‍රමාණවත් ධාරිතාවයක් නොමැති යන්ත්‍ර මිලදී ගැනීම නිසා මාස 07 ක කාලයක් තුල මෙ.ටොන් 37 ක තොගයක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. | ගත හැකි ආකෘතියකින් යුත් කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍රයක පිරිවිතරයන් ලබා ගෙන අදාළ යන්ත්‍ර ශ්‍රී ලංකා විවිධ නීතිගත සංස්ථාව මගින් මිලදී ගැනීමට කටයුතු කර ඇත. | |
| (ආ) | තේ පැළ වගාවට අවශ්‍ය නයිට්‍රජන්, පොටෑසියම් සහ පොස්පරස් යන සංඝටක අඩංගු පොහොර රජයේ පාලන මිලට මිලදී ගෙන බෙදාහැර ගොවීන්ගෙන් එම මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත පෞද්ගලික සහ රාජ්‍ය ආයතන 07 ක් වෙතින් පොහොර මෙ.ටො. 1,255 ක් රු.37,650,000 කට අධිකාරිය විසින් මිල දී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 වගන්තිය ප්‍රකාරව භාණ්ඩ ලැබුණු පසු ස්ථාන භාර නිලධාරියා විසින් සපයන ලද භාණ්ඩ, පිරිවිතරවලට හා වෙනත් එකඟ වූ නියමයන්ට අනුකූල බවට භාණ්ඩ ලැබීම් සහතිකයක් නිකුත් කළයුතු වුවත්, කුඩා තේ වතු හිමියන්ට ලබා දීම සඳහා ප්‍රාදේශිය කාර්යාල වෙත ලබා දී තිබුණු රු.මිලියන 18.1 ක් වටිනා පොහොර මෙ.ටො. 605 කට අදාළව ප්‍රමිති සහතික හා ප්‍රාදේශිය කාර්යාලවලින් නිකුත් කළ භාණ්ඩ ලැබීම් පත්‍රිකා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. එම නිසා මෙම පොහොර ලැබීම් හා බෙදා දීම් පිළිබඳ විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකිවිය. | තේ පැළ වගාව සඳහා T-200 සහ T-65 පොහොර පාලන මිලට ගෙන ප්‍රාදේශීය කාර්යාල වෙත පොහොර සමාගම් වෙතින් සෘජුව සැපයුම් කර ඇත. ඒ අනුව ලද පොහොර ප්‍රමාණයන්ට අනුව ප්‍රාදේශීය කාර්යාල විසින් භාණ්ඩ ලැබීමේ සහතික නිකුත් කර ඇත. එම පොහොර කුඩා තේ වතු හිමියන්ගෙන් මුදල් අය කිරීමෙන් අනතුරුව නිකුත් කර ඇති බව දන්වමි.<br>ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල වෙතින් කුඩා තේ වතු හිමියන් වෙත විකිණීමෙන් රැස්කර ගන්නා මුදල් ප්‍රධාන කාර්යාලයට හිඟයකින් තොරව පියවා ඇති බව දන්වා සිටිමි. | පොහොර පිරිවිතරවලට අනුකූල වන බවට හා තොග ලද බවට ප්‍රාදේශිය කාර්යාල වලින් සහතික ලබාගෙන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ඩොලමයිට් කි.ග්‍රෑම් 300 ක් නොමිලේ ලබා දීමේ අපේක්ෂාවෙන් අධිකාරියේ 2021 අයවැය ප්‍රතිපාදන යටතේ | ලබාගත යුතු ඩොලමයිට් ප්‍රමාණය ඉතාම ඉහල ඇණවුමක් වන අතර එකී මුළු ඇණවුමට සැපයිය හැකි | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව විධිමත් |

| | | |
|---|---|---|
| ඩොලමයිට් මෙ.ටොන් 13,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවෙන් රු.101,762,000 කට මිලදී ගැනීමට කටයුතු කර තිබුණද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.3 (ආ) වගන්තිය ප්‍රකාරව විධිමත් ගිවිසුමකට ඇතුළත්ව නොතිබුණි. එමෙන්ම 2021 මූල්‍ය ප්‍රකාශනවල සංවර්ධන වියදම් ලෙස මෙම සම්පූර්ණ මුදලම එනම් ප්‍රවාහන වියදම්ද සමඟ රු. 101,762,000 ක් ඇතුළත් කර තිබුණද, 2022 මැයි 31 වන විට ද අදාළ ප්‍රාදේශීය කාර්යාල වෙත සපයා තිබුණේ රු.2,132,000 ක් වටිනා ඩොලමයිට් මෙ.ටොන් 533 ක් එනම් මුළු ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 4 ක් පමණි. ඒ සඳහා ප්‍රවාහන වියදම රු. 2,062,350 ක් වූ අතර තවදුරටත් සැපයිය යුතු මෙ.ටොන් ප්‍රමාණය 12,467කි. ඒ අනුව සැපයුම ප්‍රමාදවීම හේතුවෙන් ඉදිරියේදි විශාල අතිරේක ප්‍රවාහන පිරිවැයක් දැරීමට සිදුවන බවද විගණනයේදි නිරීක්ෂණය විය. | කිසිදු සැපයුම්කරුවෙකු සොයාගැනීම දුෂ්කර වූ අතර ඔවුන් විසින් ඉහළ මිලගණන් ගන්නා බව නිරීක්ෂණය විය. ඒ අනුව අවම මිලගණන් යටතේ ඩොලමයිට් සපයනු ලබන රාජ්‍ය ආයතනයක් ලෙස ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙතින් අවම මිලක් යටතේ ඩොලමයිට් මිළදී ගැනීම සඳහා ඇණවුම් භාර දෙන ලදී. ඩොලමයිට් සපයන ප්‍රමාණයට ගෙවීමේ පදනම මත ගෙවීම් කරමින් කිසිදු මූල්‍ය අවදානමක් අධිකාරිය විසින් නොදරමින් ඩොලමයිට් මිළදී ගැනීම සඳහා කටයුතු කරන ලදී. අනතුරුව සමිති විසින් ප්‍රවහානයට යන අතිරේක මුදල කුඩා තේ වතු හිමියන්ගෙන් අයකර අදාළ ආයතනයට ගෙවා ප්‍රවාහනය කර ගැනීමට සමිති සංවිධානය එකග වී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු වෙමින් පවතින බව දන්වා සිටිමි. | ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතු අතර ඩොලමයිට් සැපයීම හා බෙදාහැරීම කාර්යක්ෂම හා ඵලදායී විය යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ අනුමත කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරි හා තේ පරීක්ෂක ව්‍යාප්ති නිලධාරි සංඛ්‍යාව පිළිවෙලින් 26 ක් හා 144 ක් වුවද නිත්‍ය නිලධාරි සංඛ්‍යාව පිළිවෙලින් 17 ක් හා 124 ක් විය. ඒ අනුව තේ ගොවීන් හා සමිති සම්බන්ධව රේඛීය සම්බන්ධතාවයක් පවත්වනු ලබන මෙම නිලධාරීන්ගේ ඇතිවන පුරප්පාඩු නොපිරවීම අධිකාරියේ සහනාධාර වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීම කෙරෙහි ඍජුව බලපාන බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ. | 2019 වර්ෂයේ මැතිවරණ කාලසීමාවක් ප්‍රකාශයට පත් වී තිබීම අනුව මුදල් අමාත්‍යංශයේ අංක DMS/Policy/Recruitments හා 2019.11.20 දින නිකුත් කර ඇති ලිපියේ උපදෙස් පරිදි බඳවා ගැනීම් සිදුකිරීමට අදාල ඉදිරි කටයුතු තාවකාලිකව අත්හිටුවා තිබූ බැවින් තේ පරීක්ෂක ව්යාප්ති නිළධාරී පුරප්පාඩු පිරවීම ප්‍රමාදවී ඇති අතර, කළාප තේ සංවර්ධන ව්‍යාප්ති නිළධාරීන් බඳවා ගැනීමට අදාලව තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරීන් කිහිපදෙනෙකු විසින් ගොනු කර ඇති නඩුවක් හේතුවෙන් ඊට අදාල බඳවා ගැනීම් සිදුකළ නොහැකිව ඇත. | අධිකාරියේ කාර්යයන් ඉටුකරගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම් කඩිනම් කළ යුතු අතර අවශ්‍ය පරිදි කාර්යය මණ්ඩල සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගත යුතුය. |

### 3.7 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව අලුත්වැඩියා කටයුතු සඳහා අංක 52-2605 දරන කැබ් රථය 2016 පෙබරවාරි 23 දිනැති 19468 දරන ඇනවුම් අංකයෙන් නාවලපිටියේ ගරාජයක් වෙත භාරදීමෙන් පසු 2019 වර්ෂයේදී එම රථයේ අමතර කොටස් ගලවා හානි සිදුකර ප්‍රධාන කාර්යාලය වෙත භාර දී තිබුණි. අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට හා ගරාජ් හිමියාට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | 52-2605 දරන රථය සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට තලංගම පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් යොමු කළ අතර, එහිදී අදාළ ගරාජය පිහිටි ප්‍රදේශයේ පොලීසිය වෙත පැමිණිල්ල යොමු කළ යුතු බව දන්වා ඇති අතර, ඒ අනුව, අදාළ පැමිණිල්ල ප්‍රධාන කාර්යාල නිලධාරීන් සහභාගි වී කඩිනමින් ගොනු කරන බව කාරුණිකව දන්වමි. | වගකිවයුතු නිලධාරීන්ට හා ගරාජ් හිමියාට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |